# ගාලු මුවදොර පුරවැසි අරගලයේ පාර්ශ්වකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන "ගාලුමුවදොරින් ඔබ්බට" පුරවැසි ඉල්ලීම් යෝජනාවලිය

## පූර්විකාව

ගෞරවනීය පුරවැසි අරගලකරුවනි,

අප මේ ගතකරමින් සිටින්නේ ඓතිහාසික නිමේෂයකි. මේ නිමේෂය තුළ අප සැවොම අපේ පරම්පරාවන්ගේ අනාගතය සහ නූපන් මතු පරපුරේ අනාගතය සුරක්ෂිත කරන, ජනතාවාදී ජනරජයක් පිළිබඳව සිහිනය හදවතේ ගැඹුරු ම තැන්හි තබාගෙන වීදී බැස සිටිමු. අප දියත් කරමින් සිටින්නේ අවිහිංසාව, ආදරය සහ ධෛර්යය මත පදනම් වූ අරගලයකි. එම අරගලයේ මූලික අරමුණ නන්දසේන ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා ප්‍රමුඛ රාජපක්ෂ රෙජීමයේ අදූරදර්ශී පාලනය අවසන් කර නව සමාජ සම්මුතියක් බිහිකර ගැනීමයි. එකී අරමුණ වෙනුවෙන් ජාති, ආගම්, කුල ගෝත්‍ර සහ පක්ෂ පාට බේදයෙන් තොරව සමස්ත ශ්‍රී ලාංකීය පුරවැසියන් එක් සිත් ව ඒකාත්මික වෙමින් සිටිනු දක්නට ලැබෙයි.

පසුගිය මාර්තු මාසයේ සිට කොළඹ ඇතුළු තදාසන්න ප්‍රදේශවල ආරම්භ කරන ලද නිහඬ විරෝධතාත්, ඉන් පසු දිවයින පුරා ගම් දනව් නගර සිසාරා පැතිර ගිය සාමකාමී උද්ඝෝෂණ ව්‍යාපාරයත් නිසා පුරවැසි හදවත්හි තැන්පත් වූ අවිහිංසාවාදී අරගලයක උණුසුම් අභිලාෂය පසුගිය අප්‍රේල් මස 09 වනදා සිට ඇරඹි "ගාලුමුවදොර නොනිදන අරගලය" සංකේතීය ව කූටප්‍රාප්තියට පත් විය. මේ මොහොතේ ජනතා අරගලයේ සංකේතීය කේන්ද්‍රස්ථානය වන ගාලුමුවදොර 'ගෝඨා ගෝ ගම' වනාහි නව පුරවැසි අපේක්ෂාවක නිහඬ ප්‍රකාශනයකි. එය දශක හතකට අධික කාලයක් තිස්සේ දූෂිත දේශපාලන සංස්කෘතිය විසින් ඇතිකරන ලදුව, 'රාජපක්ෂවාදය' විසින් පෙර නොවූ විරූ අන්දමින් දෘෂ්ටිවාදී පදනමක් මත ශ්‍රී ලාංකීය ජන සමාජය තුළට කිඳා බස්සවන ලද සකලවිධ පසුගාමීත්වයන්ට එරෙහි ව, නව සංස්කෘතික පුරවැසියකු සහිත ජනරජයක් බිහිකරගැනීම පිළිබඳව ගන්නා වූ ධෛර්යවන්ත උත්සාහයකි. එම උත්සාහයෙන් අපේක්ෂිත වන්නේ දශක හතකට අධික කාලයක් මේ මහපොළව අපවිත්‍ර කළ දුර්ගන්ධවත් දේශපාලන සංස්කෘතිය වෙනුවට නව දේශපාලන සංස්කෘතියක් පිළිබඳ ව සදාචාරාත්මක ක්‍රමවෙනසකි.

ඉතිහාසය පුරා ම අපගේ දේශපාලන සංස්කෘතිය තුළ වූ දුර්වලතා නිසා ක්‍රමික ව වර්ධනය වූ සමාජ ආර්ථික අර්බුදයන් පෙර නුවූ විරූ ලෙස උත්සන්න කිරීමට ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා ප්‍රමුඛ රාජපක්ෂ දේශපාලන රෙජීමයේ අදූරදර්ශී, දූෂිත සහ බලකාමී පාලනය සමත් වී ඇත. ඔහුගේ උද්ධච්ඡ සහ

අමනෝඥ තීරණ ගැනීම් සහ නොසලකා හැරීම් නිසා අද වනවිට අපගේ මාතෘභූමිය, අත්‍යවශ්‍ය සේවා පවා පවත්වාගත නොහැකි, බිඳ වැටුණු, අරාජික දේශයක් බවට පත් කොට තිබේ. එම අරාජික තත්වය තුළ ඇතිකරන ලද තීව්‍ර ආර්ථික, සමාජ අර්බුදයන් විසින් පුරවැසියන් කෙරෙහි ඇතිකරන ලද පීඩනය හුදු දේශපාලන අර්බුදයකට එහා ගිය මානවීය අර්බුදයක් දක්වා මේ වනවිට තල්ලු වී ඇත. ඒ අනුව මේ අර්බුදයට විසඳුම් සෙවීමේ පළමු පියවර වන්නේ ජනාධිපති නන්දසේන ගෝඨාභය රාජපක්ෂගේ පාලනය අවසන් කිරීම බව අප සැවොම කොන්දේසි විරහිත ව එකඟවන කරුණකි. එහෙත් 'ගෝටා ගෝ හෝම්' සටන් පාඨය යනු හුදෙක් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා ඉල්ලා අස්වී ගෙදර යා යුතු බව පමණක් නොවේ. ඒ තුළ ඊට වඩා බොහෝ විස්තෘත සහ අප්‍රකාශිත එකඟතා සනිටුහන්ව තිබේ.

මෙම යෝජනාවලිය තුළ දැක්වෙන්නේ එලෙස උපරිම ජන කණ්ඩායම්, සංවිධාන සහ පුරවැසියන් හට එකඟවිය හැකි අවමය ලෙස අප විශ්වාස කරන යෝජනාවලියයි. ඔබ මේ යෝජනා සමඟ එකඟ වන්නේ නම් ඔබේ නම, ඔබ නියෝජනය කරන සංවිධානයක් වේ නම් එහි නම, සහ අත්සන යෙදීමෙන් මේ සඳහා එකඟතාව පළ කළ හැකි ය. මෙම අවම පොදු ඉල්ලීම් මාලාව සඳහා එකඟ වීම හේතුවෙන් මෙයට එහා ඉල්ලීම් ඉල්ලීමට සහ ඒවා දිනාගැනීමට පුරවැසියකු ලෙස හෝ සංවිධානයක් ලෙස හෝ ඔබට ඇති අයිතිය සීමා කිරීමක් සිදු නොවේ.

මේ මොහොතේ රාජපක්ෂ රෙජීමයේ ග්‍රහණයට තවමත් නතු ව ඇති ජනතා පරමාධිපත්‍ය බලය දිනාගැනීමට ඇති ඵලදායක ම ක්‍රමය පුළුල් පුරවැසි බලයක් බව ඔබට යළිත් සිහිපත් කරමින්, අපගෙන් උපරිමයකටම එකඟ විය හැකි අවම පොදු එකඟතාව සනිටුහන් කරන මෙම යෝජනාවලිය සලකා බලා එකඟතාව මත අත්සන් කරන මෙන් ගෞරව පූර්වක ව ඉල්ලා සිටිමු.

## <u>ජනතා ඉල්ලීම්</u>

1. **ජනාධිපති ප්‍රමුඛ රාජපක්ෂ රෙජීමය නිල වශයෙන් බලය අතහැරිය යුතුය.**
    a. වර්තමානයේ රට මුහුණදෙන සියලු අර්බුදයන් මේ තාක් උත්සන්න වීමට ආසන්නතම හේතුව වත්මන් ජනාධිපතිවරයාගේ අදූරදර්ශී ක්‍රියා කලාපය යි. එම නිසා තවත් මේ රට අර්බුදයේ පතුළට වැටීම වළක්වනු වස් නන්දසේන ගෝඨාභය රාජපක්ෂ, ජනාධිපති ධූරයෙන් ඉල්ලා අස්වීමට එකඟ විය යුතු ය.
    b. කථානායකවරයා විසින් වහා ම පක්ෂනායක රැස්වීමක් කැඳවා නව අග්‍රාමාත්‍යවරකු පත්කිරීමට අවශ්‍ය මැදිහත්වීම සිදු කළ යුතු ය. ඒ අනු ව පත්කරගන්නා නව අග්‍රාමාත්‍යවරයකු සහිත ව පාර්ලිමේන්තුව වහා ම රැස්විය යුතුය. මෙම නව අග්‍රාමාත්‍යවරයා රාජපක්ෂ පවුල් රෙජීමයේ අයකු නොවිය යුතු ය; එසේ ම, මූල්‍ය, දූෂණ හෝ අපරාධ චෝදනා ලැබූවකු නොවිය යුතු ය.
    c. අග්‍රාමාත්‍යවරයා පත් වූ වහා ම ජනාධිපතිවරයා ධූරයෙන් ඉල්ලා අස්විය යුතු ය. එවිට පාර්ලිමේන්තුව මගින් නව අනුප්‍රාප්තික ජනාධිපතිවරයකු පත්කරගත යුතු ය.
    d. රාජපක්ෂ රෙජීමය සහ එම පාලන තන්ත්‍රය විසින් රාජ්‍ය ආයතන සඳහා පත් කරන ලද ප්‍රධාන තනතුරු (සභාපති ධූර, අධ්‍යක්ෂ ධූර) දරන සියලු දෙනා වහා ම එම තනතුරු වලින් ඉල්ලා අස්විය යුතු ය.

2. **සීමිත කාලයක් සඳහා අන්තර්වාර පාලනය**
    a. රටේ ආර්ථික, සමාජීය හා දේශපාලන ස්ථාවරත්වය ඇති කිරීම සඳහා පාර්ලිමේන්තුවේ පක්ෂවල එකඟතාවයෙන් නව අන්තර්වාර ආණ්ඩුවක් සීමිත කාලයක් සඳහා පිහිටවිය යුතු ය. පාර්ලිමේන්තුවේ පක්ෂ නායක එකඟතාවයෙන් එම ජාතික අන්තර්වාර පාලනයේ අග්‍රාමාත්‍යවරයා ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය පත්කර ගත යුතු ය.
    b. එලෙස නව අග්‍රාමාත්‍යවරයා සහ කැබිනට් මණ්ඩලය පත් කිරීමේදී රාජපක්ෂ පවුල් රෙජීමයේ කිසිවකු ඊට ඇතුළත් නොවිය යුතු අතර පත්වන සියලු දෙනා මූල්‍ය වංචා, දූෂණ හෝ අපරාධ සම්බන්ධ චෝදනා ලැබූවන් නොවිය යුතු ය.
    c. අමාත්‍ය මණ්ඩලය උපරිම 15 කට සීමා විය යුතු ය. පාර්ලිමේන්තුවේ ස්ථාපනය කර ඇති නමුදු දැනට ක්‍රියාත්මක තත්වයේ නොපවතින ආංශික අධීක්ෂණ කමිටු අමාත්‍යාංශ විෂයයන් අනු ව නැවත සක්‍රීය කරමින් ද, ඊට අවශ්‍ය වෙනත් බලතල තිබේ නම් ඒවා ලබා දෙමින් ද, ක්‍රියාත්මක භාවයට පත් කළ යුතු ය. එමගින් සියලු ම පාර්ලිමේන්තු

මන්ත්‍රීවරුන් සක්‍රීය ව රාජ්‍ය පාලනයට දායක කරගන්නා වැඩපිළිවෙලක් කඩිනමින් ආරම්භ කළ යුතු ය.

d. මහජන නියෝජිතයින් වෙත ලබා දෙන්නාවූ සියලු වරප්‍රසාද යළි සමාලෝචනය කර එම වරප්‍රසාද කප්පාදු කිරීම සඳහා කටයුතු කළ යුතුය.

e. නිශ්චිත කාල සීමාවකට පිහිටුවා ගන්නා මෙම අන්තර්වාර පාලනය අවසානයේ ජාතික මැතිවරණ (ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණය) එක ම දිනයක පවත්වා ජනතා පරමාධිපත්‍යය අනු ව පාලන තන්ත්‍රය පිහිටුවා ගැනීමට අවස්ථාව ලබාදිය යුතු ය.

## 3. අත්‍යාවශ්‍ය ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයන් කඩිනමින් සිදු කිරීම

a. නව අන්තර්වාර පාලනයේ පළමු කාර්යය ලෙස 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරමින් 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඔබ්බට (19+) යන ආකාරයේ විධායක ජනාධිපතිධූරයේ බලතල කප්පාදු කරන 21 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සිදු කළ යුතු ය.

b. ඉන් අනතුරුව නිශ්චිත කාලරාමුවක් තුළ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සඳහා අවශ්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ක්‍රියාවට නැංවිය යුතු ය.

c. නව ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය තුළින් ශ්‍රී ලංකාවේ වෙසෙන සියලු පීඩිත ජනකොටස්වලට (උතුරු නැගෙනහිර යුද්ධය සඳහා දීර්ඝකාලීන ව මුහුණ දුන් ජනතාව සහ අනාදිමත් කාලයක සිට කුල-ගෝත්‍ර මත පදනම් ව වෙනස්කොට සැලකීම්වලට භාජනය වන ජනකොටස් - උදා: කඳුකර වතු ප්‍රජාව, තෙළිඟු ජනතාව, ආදීවාසී ජනතාව ආදී ජනකොටස්) සාධාරණ හා යුක්තිගරුක ලෙස ජීවත්විය හැකි පසුබිමක් සහතික කිරීමේ නීතිමය ප්‍රතිසංස්කරණයන් ඇති කිරීම සහ ඒ පිළිබඳව පුළුල් ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම තුළින් නෛතික ප්‍රතිසංස්කරණ වලට සමගාමී සමාජ ප්‍රතිසංස්කරණයන් ඇති කළ යුතු ය.

d. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම මගින් ද නිර්දේශ කරන ලද සංක්‍රාන්තික යුක්ති ක්‍රියාදාමය සහ ජාතික සංහිඳියා වැඩසටහන වගවීමක් සහිත ව ක්‍රියාවට නැංවීම තුළින් යුක්තිගරුක දීර්ඝකාලීන සාමය සඳහා පදනම සැපයිය යුතු ය.

## 4. අර්බුද කළමනාකරණය

ශ්‍රී ලංකාව මේ මොහොතේ මුහුණ දෙමින් සිටින බරපතළ ආර්ථික, සමාජයීය සහ දේශපාලනික අර්බුදය මානවීය අර්බුදයක් දක්වා ව්‍යාප්ත ව ඇත. එම අර්බුදයන් විසඳීම සඳහා කෙටි, මධ්‍ය සහ දිගුකාලීන වශයෙන් ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කළ යුතු ය.

a. මේ මොහොතේ ලංකාව මුහුණ දෙන හදිසි තත්වයට (ඖෂධ ඇතුළු අත්‍යාවශ්‍ය භාණ්ඩ හිඟය) සහ ජනතාවගේ ආර්ථික පීඩනයට සහන සලසන ජන සහන අයවැයක් ගෙන ආ යුතු ය.

b. ඉහත අයවැය පදනම් කරගෙන මෙම අර්බුදයන් හමුවේ කඩා වැටී ඇති සියලුම ක්ෂේත්‍ර නඟා සිටුවීම සඳහා විශේෂ සමාජ දිරිගැන්වීම් වැඩසටහනක් ඉදිරිපත් කළ යුතු ය.

c. සාර්ව ආර්ථික සමතුලිතය සඳහා විශේෂඥ උපදෙස් සහිතව කඩිනම් ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙලක් ක්‍රියාවට නැංවිය යුතු ය.

d. එමෙන්ම ඉදිරියේදී මුහුණ දීමට සිදුවන අර්බුදයන් වලදී සහ සිදුකිරීමට නියමිත ආර්ථික ප්‍රතිව්‍යුහගත කරන වැඩසටහන් වලදී සමාජයේ අධි අවදානමට (High Vulnerability) මුහුණදීමට සිදුවන සමාජ කොටස් වලට ආරක්ෂාව සපයනු වස් සමාජ ආරක්ෂණ දැලක් (Social Security Net) වහාම සකස් කළ යුතු ය.

e. පාරිභෝගිකයින් සූරාකන කළුකඩ වෙළඳ මාෆියාවන් වහා ම පාලනය කිරීමටත් අත්‍යාවශ්‍ය භාණ්ඩවල මිල තීරණය හා ගුණාත්මක තත්ත්වය පාලනය සඳහා විධිමත් යාන්ත්‍රණයක් ගොඩනැගිය යුතු ය.

f. දැනට ක්‍රියාත්මක සියලු සංවර්ධන ව්‍යාපෘති සමාජ විගණනයකට ලක්කර හානිකර සහ අනවශ්‍ය ව්‍යාපෘති සමාලෝචනයකට ලක්කර එම ව්‍යාපෘති නතර කිරීමට හෝ සුදුසු වෙනස්කම් සහිත ව නැවත ආරම්භ කිරීමට පියවර ගැනීම සහ නිශ්චිත ප්‍රමුඛතා ලැයිස්තුවක් මත ඉදිරි සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

g. ඉදිරියේදී සිදුකරන ආර්ථික ප්‍රතිසංස්කරණ වලදී රාජ්‍ය ආයතන පිළිබඳ ව සහ ජාතික වැදගත්කමකින් යුතු සම්පත් පිළිබඳව තීරණ ගැනීමේදී වෘත්තීය සමිති, ඒ ඒ ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයින් ඇතුළු සියලු පාර්ශ්වයන්හි (all stakeholders) අදහස් විමසා විධිමත් හා පාරදෘශ්‍ය ක්‍රියාවලියක් තුළ එකී තීරණ ගත යුතු ය.

h. විදේශ ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියේ දී දේශගුණික ණය (Climate Debt) සංකල්පය කෙරෙහි අවධානයක් යොමු කිරීම තුළින් ශ්‍රී ලංකාවට ලබාගත හැකි සහනයන් ලබා ගැනීම සඳහා අවශ්‍ය රාජ්‍යතාන්ත්‍රික මැදිහත්වීම සිදු කළ යුතු ය.

## 5. වත්කම් විමර්ශනය සහ ප්‍රකාශනය

a. රාජපක්ෂ පවුල් රෙජීමයේ සාමාජිකයින් ද ඇතුළුව සියලුම මහජන නියෝජිතයින්ගේ සහ ඔවුන්ගේ සමීපතම ඥාතීන් ගේ වත්කම් හා බැරකම් පිළිබඳව වෝහාරික විගණයක් පැවැත්විය යුතුය.

b. එකී ව්‍යවහාරික විගණනය මගින් අනාවරණය වන අනිසි උපයෝගැනීම් පිළිබඳ ව විමර්ශනය කර වරදකරුවන්ට දඬුවම් ලබා දී අයථා ඉපයීම් රාජසන්තක කිරීමට කටයුතු කළ යුතු ය.

c. රටින් බැහැර කර තිබෙන අයථා ලෙස උපයාගන්නා ලද වත්කම් නැවත ශ්‍රී ලංකා රාජ්‍යය වෙත අත්පත් කරගැනීම සඳහා රාජ්‍යතාන්ත්‍රික මැදිහත්වීම් ආරම්භ කිරීම සහ එකී වත්කම් නැවත අත්පත් කරගැනීම සඳහා අවශ්‍ය නෛතික සහ තාක්ෂණික විශේෂඥතාවය ලබා ගැනීම සඳහා කටයුතු කළ යුතු ය.

d. 2003 එක්සත් ජාතීන්ගේ දූෂණවිරෝධී ප්‍රඥප්තිය ශ්‍රී ලංකාව තුළ බලාත්මක කිරීම සඳහා අවශ්‍ය නෛතික ප්‍රතිපාදන හඳුන්වා දිය යුතු ය.

## 6. නීතියේ සාධාරණත්වය තහවුරු කිරීම

a. නීතිපතිවරයාගේ ක්‍රියාදාමය සම්බන්ධයෙන් විනිවිදභාවයක් සහිතව වගවීම සහතික කරන යාන්ත්‍රණයක් (උදාහරණ ලෙස සිවිල් ක්‍රියාකාරීන්ට ද පැමිණ කරුණු දැක්විය හැකි පාර්ලිමේන්තු අධීක්ෂණ කමිටුවක් වැනි යාන්ත්‍රණයක්) ස්ථාපිත කළ යුතු ය.

b. නීතිය අවභාවිතා කරමින් පුරවැසියන්ගේ භාෂණයේ සහ ප්‍රකාශනයේ අයිතිය ඇතුළු මූලික මිනිස් අයිතිවාසිකම් සහ අනෙකුත් මානව අයිතීන් උල්ලංඝණය කරන සියලු ආකාරයේ නීතිමය අඩන්තේට්ටම් වහා ම නැවැත්වීම සඳහා නීතිමය ප්‍රතිසංස්කරණ සිදුකිරීමට පියවර ගත යුතු ය. (උදා. PTA හා යෝජිත CTA පනත් මගින් සිදුවන මූලික මිනිස් අයිතිවාසිකම් යටපත් කිරීම් වහාම ඉවත් කිරීම සඳහා පියවර ගත යුතු ය.)

c. පැවති පාලන තන්ත්‍රයන්හි අනුහසින් සිදුකරන ලද සියලු ඝාතන, පැහැරගැනීම්, අතුරුදහන් කිරීම් ඇතුළු අනෙකුත් අපරාධ පිළිබඳව දැනට විභාග කෙරෙන නඩු කිසිදු බලපෑමකින් තොර ව කඩිනමින් විභාග කිරීමට අවශ්‍ය පරිසරය සකස් කර, අපරාධ සඳහා වගකිවයුත්තන්ට නිසි දඬුවම් ලබා දිය යුතු ය.

d. දිවයින පුරා සිදුවී ඇති මේ දක්වා හෙළි වී නොමැති සියලු පුරවැසි ඝාතන, පැහැරගැනීම්, අතුරුදහන් කිරීම්, ලිංගික අපහරණ, ඉඩම් හා දේපළ පැහැරගැනීම්, දේපළ හානි, බහිරාධිකරණ ඝාතන (extrajudicial killings) ඇතුළු අනෙකුත් අපරාධ පිළිබඳ ව සත්‍ය සොයා බැලීම සඳහා 'අපරාධ යුක්ති කොමිසමක්' පත් කර එම සිද්ධිවල සත්‍ය සෙවීමට කටයුතු කළ යුතු ය. තව ද, එමගින් අනාවරණය වන තොරතුරු මත පදනම් ව නීතිය ක්‍රියාත්මක කරමින්, වගකිව යුත්තන්ට නිසි දඬුවම් ලබා දීමට කටයුතු කළ යුතු ය.

e. මෑත ඉතිහාසය තුළ දේශපාලන වුවමනාවන් මත නීතිය අවභාවිතා කරමින් සිදුකරන ලද සියලු අත්අඩංගුවට ගැනීම් තුලින් අසාධාරණයට සහ හිංසනයට ලක්වූවන්ට කඩිනමින් සාධාරණයක් ඉටු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු ය.

f. සියලු බන්ධනාගාර, මානව හිමිකම් කොමිසමේ නිරීක්ෂණයට ලක් කිරීමට ඉඩදීම මගින් සියලු ම දේශපාලන රැඳවියන්ගේ සත්‍ය තොරතුරු ලැයිස්තුවක් ප්‍රකාශයට පත් කළ යුතු ය. එසේ ම එම දේශපාලන රැඳවියන් කඩිනමින් නිදහස් කිරීමට කටයුතු කළ යුතු ය.

g. අත්තනෝමතික පරිසර සංහාරයන් සහ ජෛව සම්පත් මංකොල්ලයන් පිළිබඳව සාධාරණ සහ අපක්ෂපාතී විමර්ශනයන් කඩිනමින් සිදු කර, වගකිව යුත්තන්ට දඬුවම් ලබාදීම තුළින් යුක්තිය ඉටුවීම සහතික කළ යුතු ය.

**7. ජීවත්වීමේ අයිතිය මූලික මිනිස් අයිතිවාසිකමක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කිරීමට පියවර ගත යුතු ය. (මේ සඳහා ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ජීවත්වීමේ අයිතිය ඇතුළත් කර ඇති ආකාරය ආදර්ශයක් ලෙස භාවිතා කල හැකි ය.)**

**8. අන්තර්වාර පාලනයෙන් පසු ව පවත්වනු ලබන සියලු මැතිවරණ, නිදහස් හා සාධාරණ ලෙස පැවැත්වීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණයන් හඳුන්වා දීම**

a. මැතිවරණයක් ප්‍රකාශයට පත්වූ පසු ව මහජන සංඛ්‍යාත භාවිතා කරන සියලු ජනමාධ්‍ය නිදහස් හා සාධාරණ ලෙස ස්වාධීන ව මෙහෙයවීම සඳහා ස්වාධීන මැතිවරණ කොමිසමට බලය පැවරෙන විශේෂ නීති ප්‍රතිසංස්කරණ සිදු කළ යුතු ය. මැතිවරණය ප්‍රකාශයට පත්වූ පසු ව මහජන සංඛ්‍යාත නිකුත්කර ඇති සියලු මාධ්‍ය ආයතන විසින් සිදුකරන සියලු වැඩසටහන් අධීක්ෂණය, උපමාන නිකුත් කිරීම, මාධ්‍ය හැසිරීම පිළිබඳ ව මහජන පැමිණිලි භාරගැනීම සහ විමර්ශනය සිදුකර, අයුක්ති සහගත වැඩසටහන් පාලනය සඳහා කටයුතු කිරීමට ස්වාධීන මැතිවරණ කොමිසම යටතේ නිසි බලතල සහිත විශේෂ ඒකකයක් පිහිටුවීම ඇතුළු ව, නිදහස් හා සාධාරණ මැතිවරණයක් තහවුරු කිරීම සඳහා අවශ්‍ය වෙනත් සහ වැඩිමනත් ප්‍රතිසංස්කරණ කඩිනමින් සිදුකිරීමට මේ යටතේ යෝජනා කරනු ලැබේ.

b. විදේශ රටවල නීති පිළිබඳව ද අධ්‍යනය කරමින් මැතිවරණ ප්‍රචාරක වියදම් (Campaign Financing) සම්බන්ධව අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණ සිදු කළ යුතු ය.

c. සියලු මැතිවරණවලදී කාන්තා සහ තරුණ නියෝජනයට ඇති ඉඩප්‍රස්ථා සහතික කිරීම පිණිස මැතිවරණ නීති සඳහා අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කළ යුතු ය.